# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2449/60 - 2025 අගෝස්තු මස 15 වැනි සිකුරාදා - 2025.08.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4වන වගන්තියේ (1) වන උප වගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු 20 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2025 අගෝස්තු මස 15 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේදී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි “**2025 අංක 07 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි**” ලෙස හඳුන්වනු ලැබේ.

2. විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යතුමා ඉදිරිපත් කළ 2025 ජූලි 24 දිනැති අංක 25/1339/807/016-I දරන අමාත්‍ය මණ්ඩල සංදේශය පිළිබඳව වූ 2025 අගෝස්තු 04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මෙම රෙගුලාසි නිකුත් කරනු ලැබේ.

3. 2024 මැයි 17 දිනැති අංක 2384/34 දරන අතිවිශේෂ *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද 2024 අංක 07 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල අංක 12 දරන රෙගුලාසිය, එහි “2025 ජූනි මස 30 දක්වා” යන්න අවලංගු කර “2025 සැප්තැම්බර් මස 30 දක්වා” යන්න ආදේශ කිරීමෙන් මෙමගින් සංශෝධනය කෙරේ.

මෙම රෙගුලාසි අදාළ වන්නේ ඉහත සඳහන් 2025 ජූලි 24 දිනැති අංක 25/1339/807/016-I දරන අමාත්‍ය මණ්ඩල සංදේශය පිළිබඳව වන 2025 අගෝස්තු 04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි, 2024 අප්‍රේල් 01 දිනැති අංක 24/0644/615/003-I දරන අමාත්‍ය මණ්ඩල සංදේශය පිළිබඳව වූ 2024 අප්‍රේල් 01 දිනැති අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ප්‍රකාරව සංචාරක විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද "වාහන ආනයන බලපත්‍රයක්" යටතේ, 2025 ජනවාරි 31 දින හෝ ඊට පෙර ස්ථාපිත ණයවර ලිපි මත ආනයනය කරන ලද මෝටර් වාහන රේගුවෙන් නිදහස් කිරීම සඳහා පමණක් වේ.

4. මෙම රෙගුලාසිවල අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් රේගු අධ්‍යක්ෂ ජනරාල් වෙත, බලපත්‍රලාභී බැංකු වෙත හෝ වෙනත් අදාළ ආයතන වෙත "මෙහෙයුම් උපදෙස්" නිකුත් කරනු ලැබිය යුතුය.

EOG 08 - 0274

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.